# වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
# நீர்ப்பாசன மற்றும் நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF IRRIGATION AND WATER RESOURCES & DISASTER MANAGEMENT

විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை.
Vidya Mawatha, Colombo 07, SRI LANKA
e mail - info@disastermin.gov.lk

ාර්යාලය / லுவலகம் / ffice } 0112665170

ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112665170


මගේ අංකය / னது இல / My No. } NDRSC/01/04/01/2018

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2018.05.

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,**

**<u>ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ආපදාවන්ගෙන් හානියට පත් දේපළ සඳහා රක්ෂණ වන්දි පිරිනැමීම.</u>**

ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ස්වාභාවික ආපදාවන්ගෙන් හානියට පත්වන දේපළ සඳහා වන්දි මුදල් ලබා දීමේ කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳ ජාතික රක්ෂණ භාර අරමුදලේ ද එකඟතාවය මත පහත සඳහන් උපදෙස් ඔබ වෙත ලබා දෙන අතර ඒ අනුව ආපදා අවස්ථාවන්හිදී හානියට පත්වන දේපළ සඳහා අත්තිකාරම් මුදල් ලබා දීම හා හානි තක්සේරු කටයුතු සිදු කර වන්දි මුදල් ලබා දීමේ කටයුතු කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

01. ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ වන්දි ලබා දීමේදී ස්වාභාවික ආපදාවක් හේතුවෙන් අදාළ දේපළවලට සිදුවූ හානිය පමණක් පියවීම සඳහා (indemnity basis) රක්ෂණ වන්දි ලබා දීමට කටයුතු කරන අතර හානියට පත් දේපළ වැඩි දියුණු කිරීම වෙනුවෙන් හෝ හානියට පත් දේපළ සඳහා නව අංගයන් ඇතුළත් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරනු නොලබන බැවින් සිදුවූ හානිය පමණක් පූර්ණය කිරීමට අදාළව තක්සේරු කටයුතු සිදු කර අදාළ වන්දි මුදල් ඉල්ලීම සිදුකළ යුතුය.

02. හානියට පත් නිවස සහ එහි ගෘහ උපකරණ සඳහා හානි තක්සේරු කමිටුවේ නිර්දේශය මත ගෙවීම් කළ හැකි උපරිම මුදල රුපියල් මිලියන 2.5 ක් වන අතර එම මුදලින් ගෘහ උපකරණ හානි සඳහා ලබා දිය හැකි උපරිම වන්දි මුදල් ප්‍රමාණය රුපියල් 25,000/- කි.

03. හානි වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ස්ථාන හා එහි යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා තොග හානි සඳහා හානි තක්සේරු කමිටුවේ නිර්දේශය මත ගෙවීම් කළ හැකි උපරිම මුදල රු මිලියන 2.5 ක් වන අතර යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා තොග සඳහා හානි සඳහා ලබා දිය හැකි උපරිම වන්දි මුදල් ප්‍රමාණය රුපියල් රුපියල් 100,000/- කි.

04. හානියට පත් නිවාස වෙනුවෙන් රුපියල් 10,000/- දක්වා වූ අත්තිකාරම් මුදල් ලබාදීම සඳහා වගුව 8.1. හි සඳහන් කමිටු සාමාජිකයින් විසින් අදාළ දේපළ හානිය පරීක්ෂා කර ජා.ආ.ස.සේ.ම. 09 (I) අයදුම්පතෙහි නිර්දේශ ලබාදීම සිදු කළ යුතුය. ඒ අනුව අදාළ ප්‍රතිලාභීන් වෙත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් මුදල් ගෙවීම සිදු කර ප්‍රතිලාභියාගේ අත්සන සහිත ජා.ආ.ස.සේ.ම. 09 (I) අයදුම්පත වගුවේ 8.1.1 හි දක්වා ඇති ලේඛන සමඟ දින 90 ක් ඇතුළත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතුය.

05. රුපියල් 10,000/ ට වැඩි රුපියල් 25,000/- දක්වා වූ දේපළ හානි තක්සෙරු කිරීම සඳහා ජා.ආ.ස.සේ.ම. 09 (V) හා ජා.ආ.ස.සේ.ම. 09 (VI) අයදුම්පත්‍ර භාවිත කළ යුතු අතර 8.2 වගුවෙහි සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් තක්සේරු කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් අදාළ ප්‍රතිලාභීන් වෙත වන්දි මුදල් ලබා දිය යුතුය. ඒ සඳහා අවශ්‍ය මුදල් ජා.ආ.ස.සේ.ම. 09 (III) ආකෘතිය මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉල්ලුම් කළ යුතුය. ප්‍රතිලාභීන්ට ගෙවීම් සිදුකරීමෙන් අනතුරුව අදාළ සියලු ලේඛන (වගුවේ 8.2.1හි දක්වා ඇති පරිදි) දින 90 ක් ඇතුළත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතුය.

06. රුපියල් 25,000/- ට වැඩි දේපළ හානි තක්සෙරු කිරීම සඳහා ද ජා.ආ.ස.සේ.ම. 09 (V) හා ජා.ආ.ස.සේ.ම. 09 (VI) අයදුම්පත්‍ර භාවිත කළ යුතු අතර 8.3 හි සඳහන් කමිටු සාමාජිකයින් විසින් තක්සේරු කළ දේපළ හානි අයදුම්පත් දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ සහිත ජා.ආ.ස.සේ.ම 09(IX) ආකෘතිය මඟින් අදාළ සියලු ලේඛන සමඟ (වගුවේ 8.3.1හි දක්වා ඇති පරිදි) දින 30 ක් ඇතුළත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතුය.

07. රක්ෂණ වන්දි හිමි දේපළවලට අදාළව යොමු කරනු ලබන සෑම අයදුම්පතක් සමඟම ජා.ආ.ස.සේ.ම. 09 (I), ජා.ආ.ස.සේ.ම. 09 (V) හෝ ජා.ආ.ස.සේ.ම. 09 (V) ආකෘති පත්‍ර හා නිවසෙහි හෝ ව්‍යාපාරික ස්ථානයේ හානිය පිළිඹිබු කළ හැකි ඡායාරූප 02 ක් ජාතික රක්ෂණ භාර අමුදල වෙත යොමු කළ යුතු බැවින් හානි තක්සේරු කමිටුව වෙත එම ඡායාරූප අනිවාර්යයයෙන් ලබා දෙන ලෙස අදාළ වන්දි අයදුම්කරුවන් දැනුවත් කළ යුතුය.

08. දේපළ හානි පරීක්ෂා කිරීම හා හානි තක්සේරු කිරීම සඳහා පත් කළ යුතු කමිටුවල සාමාජිකයන් හා එක් එක් අවස්ථාවේ ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතු ලේඛන පහත වගුවේ දැක්වේ.

| හානියේ ස්වභාවය / හානි වටිනාකම | කමිටුවේ සිටිය යුතු නිලධාරීන් | ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතු ලේඛන |
|---|---|---|
| හානියේ ස්වභාවය හෝ හානි තක්සේරුවේ වටිනාකම රු. 10,000/- දක්වා නිවාස හානි සඳහා | 8.1.<br>• අදාළ වසමේ ග්‍රාම නිලධාරී ඇතුළු පහත සඳහන් නිලධාරීන්ගෙන් නිලධාරීන් දෙදෙනෙකු<br>• ආර්ථික සංවර්ධන නිලධාරී<br>• සමෘද්ධි සංවර්ධන නිලධාරී<br>• කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර | 8.1.1<br>• ජා.ආ.ස.සේ.ම. 09 (I) අයදුම්පතේ මුල් පිටපත්<br>• හානියට පත් දේපළෙහි ඡායාරූප 02 |
| හානියේ ස්වභාවය හෝ හානි තක්සේරුවේ වටිනාකම රු. 10,000/- ට වැඩි රුපියල් 25,000/- දක්වා වූ දේපළ හානි සඳහා | 8.2.<br>• තාක්ෂණික නිලධාරී<br>• අදාළ වසමේ ග්‍රාම නිලධාරී<br>• ආපදා සහන සේවා නිලධාරී ප්‍රාදේශීය ලේකම් විසින් නම්කරනු ලබන සංවර්ධන නිලධාරියෙකු | 8.2.1<br>• ජා.ආ.ස.සේ.ම. 09 I අයදුම්පත් මුල් පිටපත්<br>• නිවාස/ ගෘහ උපකරණ සඳහා ජා.ආ.ස.සේ.ම.09 (V) අයදුම්පත්වල මුල් පිටපත්<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ස්ථාන / යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා ජා.ආ.ස.සේ.ම.09 (VI) අයදුම්පත්වල මුල් පිටපත්<br>• ජාතික හැඳුනුම්පතේ පිටපත<br>• හානියට පත් දේපළෙහි ඡායාරූප 02<br>• දේපළ අයිතිය සනාථන ලියවිලි , ඔප්පු පිටපත් |
| හානියේ ස්වභාවය හෝ හානි තක්සේරුවේ වටිනාකම රු. 25,000/- ට වැඩි දේපළ හානි සඳහා | 8.3<br>• අදාළ වසමේ ග්‍රාම නිලධාරී<br>• ජාතික රක්ෂණ භාර අරමුදලේ තක්සේරු නිලධාරී<br>• ආපදා සහන සේවා නිලධාරී හෝ ආර්ථික සංවර්ධන නිලධාරී<br>• තාක්ෂණික නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නම්කරනු ලබන සංවර්ධන නිලධාරියෙකු | 8.3.1<br>• ජා.ආ.ස.සේ.ම. 09 (I) අයදුම්පත් මුල් පිටපත්<br>• නිවාස/ ගෘහ උපකරණ සඳහා ජා.ආ.ස.සේ.ම.09 (V) අයදුම්පත්වල මුල් පිටපත්<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ස්ථාන / යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා ජා.ආ.ස.සේ.ම.09 (VI) අයදුම්පත්වල මුල් පිටපත්<br>• ජාතික හැඳුනුම්පතේ පිටපත<br>• හානියට පත් දේපළෙහි ඡායාරූප 02<br>• දේපළ අයිතිය සනාථන ලියවිලි , ඔප්පු පිටපත් |

09. නිවාස හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනැගිලි හානි තක්සේරු කිරීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ඔබ වෙත යොමු කර ඇති හානි ප්‍රතිපූර්ණය කිරීමේ පිරිවැය ඇස්තමේන්තු මාර්ගෝපදේශය 2018 දෙසැම්බර් 31 දින දක්වා වලංගු වේ.

හානි වූ දේපළ වෙනුවෙන් කඩිනමින් වන්දි ගෙවීම් කළ යුතු බැවින් හානි තක්සේරු කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙනත් රජයේ ආයතනවල සේවය කරන තාක්ෂණික නිලධාරීන්ගේ සහායත්, ආපදාවට ලක් නොවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තාක්ෂණික නිලධාරීන්ගේ සහයත් මෙම කටයුතු සඳහා ලබා ගන්නා ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

ඉංජිනේරු එන්. ඒ. සිසිර කුමාර
ලේකම්
වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත්:
01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ගැ.ස.
02. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කා.දැ.ගැ.ස.
03. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
04. සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල - කා.දැ.ගැ.ස.
05. ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල - කා.දැ.ගැ.ස.